නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අල්- කුර්ආන් පාරායනය කෙසේ වී දැයි අනස් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් විමසන ලදී. එවිට එතුමා: "හඩ දිගුවට ඇද පාරායනය කරන ආකාරයෙන් විය

කතාදා තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අල්- කුර්ආන් පාරායනය කෙසේ වී දැයි අනස් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් විමසන ලදී. එවිට එතුමා: "හඩ දිගුවට ඇද පාරායනය කරන ආකාරයෙන් විය" යැයි පවසා පසුව 'බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්' (සූරා අල්-ෆාතිහා 1) හි බිස්මිල්ලාහ් යන පදය අදිමින් රහ්මාන් යන
පදය ද අදිමින් රහීම් යන පදය ද අදිමින් පාරායනය කර පෙන්වීය. [صحيح] [رواه البخاري]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අල්-කුර්ආන් පාරායනය කෙසේ වී දැයි අනස් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් විමසන ලදී. එවිට එතුමා: "පාරායනයේ දී එතුමාණන්ගේ හඩ දිගුවට ඇද පාරායනය කරන ආකාරයෙන් විය." 'අල්ලාහ්' නම් පදයේ 'හා' ස්වරයට පෙර ඇති 'ලාම්' ස්වරය ඇද්දහ. 'රහ්මාන්' යන පදයේ 'නූන්' ස්වරයට පෙර 'මීම්' ස්වරය ඇද්දහ. 'රහීම්' යන පදයේ 'හා' ස්වරය ඇද්දහ." යනුවෙන් පැවසුවේය.

https://sunnah.global/hadeeth/si/show/65245